# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,532 —1965 ඔක්තෝබර් 12 වැනි අඟහරුවාද—1965.10.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1965 අංක 381**

**අ. ආ. කා. අංකය : සී. 270/65 (2).**

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ඉමියා මුදියන්සෙලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල මහතා දිවයිනට පෙරළා පැමිණෙනු තුරු, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 49 වැනි වගන්තිය යටතේ, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු සිළිබඳ ගරු ඇමතිතුමන්ගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගාමණී නන්ද ජයසූරිය මහතා 1965 ඔක්තෝබර් 9 වැනි දින සිට අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

නි. විජේවර්ධන,

අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 ඔක්තෝබර් 9 වැනි දින,

කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේ දී.

10–612

---

## මිළ පාලන දන්වීම්

**අංක 1965 ජී. 3 දරන ආහාර මිල ආඥාව** | **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**මිළ පාලන පනත**

**ආඥාව**

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගාලු දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් ගාර්දියේ පුංචිහේවාගේ බුද්ධදස ද සිල්වා වන මම, මේ ආඥාවෙන්—

(i) 1965 මාර්තු 9 වන දින අංක 14,339 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ 1965 මාර්තු 3 වන දින අංක ජී. 1 දරන ආහාර මිල ආඥාව, වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි ;

(ii) මෙහි වූ උපලේඛනයේ 3 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ තොග වෙළෙන්දකු විසින් විකිණිය හැකි උපරිම තොග මිල ලෙස එවකට නියම කර ඇති මිල, ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත ව සඳහන් ද්‍රව්‍යයේ දළ බර හොණ්ඩරයක් ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම තොග මිල විය යුතු ලෙස වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි ;

(iii) මෙහි වූ උපලේඛනයේ 4 වන තීරයෙහි දක්වෙන මුදල එකතු කරන ලද, (173 වන අධිකාරය වන) මිල පාලන පනත යටතේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දකු විසින් විකිණිය හැකි උපරිම සිල්ලර මිල ලෙස එවකට නියම කර ඇති මිල, ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයේ ශුද්ධ බර රාත්තලක් ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ විකිණිය හැකි හා එයට ඉහළින් නො විකිණිය යුතු උපරිම සිල්ලර මිල විය යුතු ලෙස, වහාම බල පැවැත්වෙන පරිදි නියම කරමි ;

(iv) මෙම ආඥාවේ කාර්යය සඳහා—

(අ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් ද්‍රව්‍යයක යම් ප්‍රමාණයක් නැවත විකිණීමේ කාර්‍ය සඳහාවූ යම් විකිණීමක් හෝ ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් වූ යම් විකිණීමක් තොග වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්,

(ආ) මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස දළබර හොණ්ඩරයකට අඩු යම් ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් වූ විකිණීමක් විය යුතු බවත්,

නියම කරමි ;

(v) මෙම ආඥාවෙන් වැඩිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිම තැනැත්තකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි ;

(vi) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක හෝ මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකු විසින්ම ඒ ද්‍රව්‍යයෙන් ප්‍රමාණවත් කොටසක් සුදුසු භාජනයක බහා එම ද්‍රව්‍ය සඳහා මෙම ආඥාවෙන් නියමිත උපරිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල සූචකයක හෝ මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍යය සහ ඒ සඳහා නියම කරන ලද උපරිම මිල යම් ගනුදෙනු කරුවකුට පැහැදිළිව පෙනෙන සේ ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රදර්ශනය කළයුතු බව නියම කරමි ;

(vii) මෙම ආඥාවේ කාර්යය සඳහා "රාත්තල" හෝ "රා." යන්නෙන් ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර සැලකිය යුතු බව නියම කරමි ;

(viii) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා ඒ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම ගැනුම් කරු ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය,
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව),
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් විකිණීම තොග වශයෙන් ද, නැත්හොත් සිල්ලර වශයෙන් ද යන බව ඇතුලත් කුවිතාන්සියක් ගැනුම් කරුට දිය යුතු බව නියම කරමි ;

(ix) මෙහිවූ උපලේඛනයේ 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට, ඒ විකුණනු ලැබූ ද්‍රව්‍යය යම් දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම්, එහි මිළත් ඒ උපලේඛනයේ 3 වන සහ 4 වන තීරයන්හි සඳහන් උපරිම මිළට ඇතුළත් වියයුතු බව නියම කරමි.

1965 ඔක්තෝබර් මස 8 වන දින ප. ව. 3 ට ගාල්ලේ දී අත්සන් කරන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
ගාල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක.

## උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය |
|---|---|---|---|
| ද්‍රව්‍යය | ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | තොග වෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය | සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සභා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය |
| | | රු. ශ. | රු. ශ. |
| ලූනු (රතුලූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් සියළුම වර්ග)<br>රතුළූනු<br>අර්තාපල් | බෙන්තොට ගම්කායී සභා සීමාව, කොස්ගොඩ ගම්කායී සභා සීමාව, ඌරගස්මන්හන්දිය ගම්කායී සභා සීමාව ... ... | 1 72 ... | 0 2 |
| කොත්තමල්ලි<br>උළුඳු (පියලි නොකල)<br>මුංඇට ...<br>තෝර පරිප්පු ...<br>කඩල පරිප්පු ...<br>සියඹලා ... | එම ... | 2 72 ... | 0 2 |
| ලූනු (රතුළූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් සියළුම වර්ග)<br>රතුළූනු ...<br>අර්තාපල් ... | ගාල්ලේ නගර සභා සීමාව සහ කඩවත් සතර, අම්බලන්ගොඩ පලාත් ආණ්ඩු සභාව, බලපිටිය සුළු නගර සභාව, වතුගෙදර සුළු නගර සභාව, ඇල්පිටිය සුළු නගර සභාව, හික්කඩුව සුළු නගර සභාව, දෙඩන්දුව සුළු නගර සභාව, ඇල්පිටිය ගම්කායී සභාව, කරන්දෙනිය ගම්කායී සභාව, බටපොල ගම්කායී සභාව, මාදම්පේ ගම්කායී සභාව, වෙරගොඩ ගම්කායී සභාව, හික්කඩුව ගම්කායී සභාව, රත්ගම ගම්කායී සභාව, බද්දේගම ගම්කායී සභාව සහ බෝපේ ගම්කායී සභාව | 1 86 ... | 0 2 |
| කොත්තමල්ලි ...<br>උළුඳු (පියලි නොකල)<br>මුංඇට ...<br>තෝර පරිප්පු ...<br>කඩල පරිප්පු ...<br>සියඹලා ... | එම ... | 2 86 ... | 0 3 |
| ලූනු (රතුළූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් සියළුම වර්ග)<br>රතුළූනු ...<br>අර්තාපල් ... | අහංගම සුලු නගර සභා සීමාව, අක්මීමන ගම්කායී සභා සීමාව, හබරාදුව ගම්කායී සභා සීමාව, කෝදගොඩ ගම්කායී සභා සීමාව, කොට්ටව ගම්කායී සභා සීමාව, නාගොඩ ගම්කායී සභා සීමාව, පෝද්දල ගම්කායී සභා සීමාව, වඳුරඹ ගම්කායී සභා සීමාව, තෙලිකඩ–මාපුවාන ගම්කායී සභා සීමාව, වැලිවිටිය-දිවිතුර ගම්කායී සභා සීමාව, වැයිහේන ගම්කායී සභා සීමාව, සහ කතළුව ගම්කායී සභා සීමාව | 2 05 ... | 0 2 |
| කොත්තමල්ලි ...<br>උළුඳු (පියලි නොකල)<br>මුංඇට ...<br>තෝර පරිප්පු ...<br>කඩල පරිප්පු ...<br>සියඹලා ... | එම ... | 3 05 ... | 0 3 |

| 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය |
|---|---|---|---|
| ද්‍රව්‍යය | ප්‍රදේශය හෝ පරිපාලන දිස්ත්‍රික්කය | තොග වෙළෙන්දකු විසින් දළබර භාණ්ඩරයක් විකිණිය හැකි, කොළඹ මහ නගර සහා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය | සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි, කොළඹ මහ නගර සහා ප්‍රදේශය සඳහා නියමිත මිලට වඩා වැඩි අධිකය |
| | | රු. ශ. | රු. ශ. |
| ලූනු (රතුළූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් සියළුම වර්ග) | හිනිදුම ගම්කායයී සහා සීමාව, ඕපාත ගම්කායයී සහා සීමාව සහ නෙළුව ගම්කායයී සහා සීමාව ... | ... 2 11 | ... 0 2 |
| රතුළූනු ... | | | |
| අර්තාපල් ... | | | |
| කොත්තමල්ලි ... | එම | ... 3 11 | ... 0 3 |
| උළුඳු (පියලි නොකළ) | | | |
| මුංඇට ... | | | |
| තෝර පරිප්පු ... | | | |
| කඩල පරිප්පු ... | | | |
| සියඹලා ... | | | |

සැලකිය යුතුය.—මෙ මිල ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු ලෙස නියමකර ඇති මිල නොවේ, ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිල වන අතර ඊට ඉහළින් ඒ ද්‍රව්‍ය නො විකිණිය යුතුය.

10–626

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" ය නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි